# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2160/45 - 2020 ජනවාරි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවමින් (2019 මාර්තු මස 27 වන දින අංක 2116/44 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2005 ජුනි මස 01 වන දින අංක 1395/15 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''1. ව්‍යවහාරික විද්‍යා පීඨය'' යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන ''2. පරිඝනක විද්‍යා හා තොරතුරුවේද අධ්‍යයනාංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''3. ව්‍යවහාරික භූ විද්‍යා අධ්‍යයන අංශය''.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

02 - 275

1A - PG 4861 — 518 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*